# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1267/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 திக |
| දිනය<br>Date | 03/08/2024<br>පැය 1455 | | |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කතෘ / ප්‍රවෘත්ති කතෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

### අතිපූජ්‍ය ගලබොඩ ඥාණිස්සර නාහිමිපානන්ගේ අවමංගල පූජෝත්සවයේ රථවාහන සැලැස්ම - කොම්පඤ්ඤවීදිය පොලිස් වසම.

2024.08.02 වන දින අපවත් වී වදාල ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය ගලබොඩ ඥාණිස්සර නාහිමිපානන්ගේ ශ්‍රී දේහය මේ වන විට මහජන ගෞරවය සඳහා හුණුපිටිය ගංගාරාම විහාරස්ථාන පරිශ්‍රයේ තැන්පත් කර ඇති අතර ආදාහන පූජෝත්සවය 2024.08.05 වන දින හුණුපිටිය ගංගාරාම විහාරස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිතව ඇත.

මෙම ආදාහන පූජෝත්සවය සඳහා විශාල ජනකායක් සහභාගී වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර ආදාහන පූජෝත්සවය පැවැත්වෙන 2024.08.05 වන දින පස්වරු 02.00 සිට රාත්‍රී 08.00 දක්වා කාලය තුල රථ වාහන තදබදය අවම කර ගැනීම සඳහා විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව එම කාලය තුල පහත මාර්ගයන් වල රථවාහන ගමනාගමනය සීමා කරනු ලබන බව පොලිසිය මහජනතාව වෙත දන්වා සිටියි .

**රථවාහන ගමනාගමනය සීමා කරනු ලබන මාර්ග**

- ධර්මපාල මාවත ජේම්ස් පිරීස් මාවත හන්දියෙන් ජේම්ස් පිරීස් මාවත දෙසට ඇතුල් වීම ( පෙරහැර මාවතෙන් සහ ජිනරථන මාවෙතෙන් විහාරස්ථානයට ඇතුල් වන වාහන හැර)
- ජේම්ස් පීරිස් මාවත පෙරහැර හන්දියෙන් කොම්පඤ්ඤවීදිය හන්දිය දෙසට ඇතුලු වීම ( ජිනරථන මාවතෙන් විහාරස්ථානයට ඇතුල් වන වාහන හැර)
- මුත්තයියා පාරෙන් ජේම්ස් පීරිස් මාවතට ඇතුල් වී කොම්පඤ්ඤ වීදිය හන්දිය දෙසට පමණක් ගමන් කළ හැක.

- අල්ටෙයාර් දෙස සිට ජේම්ස් පීරිස් මාවතට ඇතුළු වන වාහන කොම්පඤ්ඤවීදිය හන්දිය දෙසට පමණක් ගමන් කල හැක.
- නවම් මාවත දෙස සිට ජේම්ස් පීරිස් මාවතට ඇතුළු වන වාහන කොම්පඤ්ඤවීදිය හන්දිය දෙසට පමණක් ගමන් කළ හැකිය.
- කොම්පඤ්ඤවීදිය හන්දියෙන් ජේම්ස් පීරිස් මාවතට ඇතුළු වන වාහන නවම් මාවත හන්දිය දක්වා පමණක් ගමන් කළ හැකිය.
- මුත්තයියා පාර බේබෘක් හන්දියෙන් මුත්තයියා පාර දෙසට ඇතුලු වීම වසා ඇත.
- ජිනරථන මාවත පාක් වීදිය හන්දියෙන් විහාරස්ථානය දෙසට ඇතුළු වීම වසා ඇත.
- රාමනායක මාවත හුණුපිටිය පාර හන්දියෙන් හුණුපිටිය පාරට ඇතුළු වීම වසා ඇත.

තවද ආදාහන පුජෝත්සවය සඳහා පැමිණෙන මහජනතාවගේ වාහන නැවැත්වීම සඳහා අල්ටෙයාර් ගොඩනැගිල්ල පිටුපස භූමියේ පහසුකම් සලසා ඇත. 2024.08.03 වන අද දින සිට විහාරස්ථානයට ඇතුලු වන සියළුම වාහන ජේම්ස් පීරිස් මාවත, ජිනරථන මාවත හන්දියෙන් ඇතුලු විය යුතුය. ඩෝසන් වීදියෙන් ජිනරථන මාවතට ඇතුලු වීම වසා තබනු ලබන අතර ජිනරථන මාවතේ වාහන ගමනාගමනය එක් දිශාවකට පමණක් සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**